**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත**

9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

**ඒකකය 3.3 - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය**

**පැවරුම් අංක 5 - 7 වන සතිය (2021.07.12-2021.07.16)**

**ක්‍රියාකාරකම 9. 3. 4** - ප්‍රජාතන්ත්‍රවාදය ජන සමාජයක මැතිවරණ හා ඡන්ද බලය පිළිබඳ විමර්ශනය කිරීම.

**හැඳින්වීම** - දේශපාලන ඡන්ද බලය , මැතිවරණ මහජනතාව පාලනයට සහභාගි වන අවස්ථා ,සර්වජන ඡන්ද බලය, ශ්‍රී ලාංකික ජනතාවට ඡන්ද බලය ලැබීම ,ඡන්ද බලය ලබා ගැනීමට සපුරාගත යුතු සුදුසුකම්, ඡන්ද ප්‍රකාශ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ,ඡන්ද බලයේ වැදගත්කම හා මැතිවරණ සම්බන්ධ ජනතා අයිතිවාසිකම් හා යුතුකම් මෙහිදී හඳුනාගත හැකිය.

**ගුණාත්මක යෙදවුම්** - ශිෂ්‍ය පාර්ලිමේන්තු ඡන්දය ප්‍රකාශ ඡන්ද පත්‍රිකා ආකෘතියක් (එසේ නොමැති අය වැඩිහිටියන් ගෙන් විමසා දැනගන්න) පෙළපොත , සටහන් පොත , ලියන පෑන්

**ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස් : -**

පියවර 1 - පෙළ පොතේ පිටු අංක 79-83 දක්වා අවබෝධයෙන් කියවන්න.

පියවර 2 - කලින් අවස්ථාවල මෙන්ම අභ්‍යාස පොත භාවිතා කර ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න.

**ප්‍රශ්නාවලිය**

1. ඡන්ද බලය යනු කුමක්ද?
2. ඡන්දය හිමි වන වයස හා ඡන්ද බලය අහිමි වීමට බලපාන හේතු මොනවාද?(1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව)
3. මැතිවරණ යන්න කුමක්දැයි හඳුන්වා ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ වර්ග මොනවාද?
4. සර්වජන ඡන්ද බලය හඳුන්වා එය ලබා ගත් ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
5. ඡන්ද බලය ලබා ගැනීමට සපුරාගත යුතු සුදුසුකම් මොනවාද?
6. ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා ඡන්ද බලයේ වැදගත්කම පෙන්වීමට කරුණු තුන බැගින් ඉදිරිපත් කරන්න.
7. නියෝජන ක්‍රම හඳුන්වා ඒවා පැහැදිලි කරන්න.

**පසු වැඩ**

මැතිවරණ සම්බන්ධයෙන් පුරවැසියා විසින් එනම් ඡන්ද දායකයා විසින් ඉටු කළ යුතු යුතුකම් හා ඔහුට ලැබිය යුතු අයිතිවාසිකම් මොනවාද යන්න පෙන්වා දීමට වගුවක් පිළියෙල කරන්න.(පෙළ පොත හා වැඩිහිටි උපදෙස් ලබාගන්න).

ඉදිරිපත් කිරීම

ර/ ශ්‍රී රත්නාකර මහා විද්‍යාලයේ පුරවැසි අධ්‍යාපන විෂය භාර

ආචාර්ය එම්.ඒ.පත්මලතා මිය